DOI : 10.31357/fhssmst.2009.00691

# සහභාගිත්ව සංවර්ධන ව්‍යාපෘති තුළ කාන්තා සවිබලකරණ ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යයනයක්

(තෝරා ගත් සහභාගීත්ව සංවර්ධන ව්‍යාපෘති ඇසුරින්)

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවි...
25 NOV 2010
පශ්චාද් උපාධි අධ්‍ය...

සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා 2009.07.30 දින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය වෙත ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය

## කර්තෘගේ ප්‍රකාශය

සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි අවශ්‍යතා සපුරාලීම සඳහා ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය මහාචාර්ය මයුර ටී. සමරකෝන් මහතාගේ මාර්ගෝපදේශකත්වය යටතේ සම්පාදනය කරනු ලැබූවකි. මෙහි අන්තර්ගත කිසිම කරුණක් වෙනත් විශ්ව විද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක උපාධි අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද්දක් නොවන බව සහතික කරමි.

25/11/2010 ------------------ ---------------

දිනය ඒ.පී. කේ. අමරදාස

## උපදේශකවරයාගේ ප්‍රකාශය

සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පර්යේෂණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ඒ. පී. කේ. අමරදාස විසින් ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය මාගේ අධීක්ෂණය සහ මග පෙන්වීම යටතේ සම්පාදනය කරනු ලැබුවකි. මෙම පර්යේෂණ කෘතිය ශාස්ත්‍රපති උපාධි පර්යේෂණයේ ඇගයීම් කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු මට්ටමක පවතින බව තව දුරටත් මෙයින් සහතික කරමි.

..................................

මහාචාර්ය මයුර ටී. සමරකෝන්

25/11/2010
..............................

දිනය

පරීක්ෂක මණ්ඩලය විසින් නිර්දේශිත සියළු නිවැරදි කිරීම් සංශෝධනය සහ එකතු කිරීම් උපාධි අපේක්ෂිකාව විසින් අවසාන නිබන්ධය සඳහා ඇතුලත් කර ඇති බව මින් සහතික කරමි.

------------------------------      ------------------------------

මහාචාර්ය මයුර සමරකෝන්      ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය එම්.ඩබ්.ජයසුන්දර

උපදේශක      අධ්‍යයනාංශ ප්‍රධාන

## පටුන

| | පිටු අංකය |
|---|---|
| පටුන | I-VI |
| සංඛ්‍යා වගු | VII-VIII |
| රූප සටහන් | IX |
| ස්තුතිය | X |
| ප්‍රස්ථාර | XI |
| සංක්ෂිප්තිය | XII |

**1 පරිච්ඡේදය** **1-23**

**හැඳින්වීම හා ක්‍රමවේදය**

1. මාතෘකාව

1.1 හැඳින්වීම

1.2 පර්යේෂණ ගැටළුව

1.3 අධ්‍යයනයේ අරමුණු

1.3.1 ප්‍රධාන අරමුණ

1.3.2 සුවිශේෂී අරමුණු

1.4 අධ්‍යයන ක්ෂේත්‍රය

1.5 ක්‍රමවේදය

1.5.1.1 මූලාශ්‍ර

1.5.1.2 අධ්‍යයන නියැදිය

1.5.1.3. දත්ත රැස් කිරීමේ ක්‍රම

1.5.1.3.1 සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය

1.5.1.3.2 ඉලක්කගත සම්මුඛ සාකච්ඡා

1.5.1.3.3 නිරීක්ෂණය

1.5.1.3.4 සිද්ධි අධ්‍යයන

1.6 අධ්‍යයනයේ සීමා

1.7 පර්යේෂණ දුෂ්කරතා

1.8 දත්ත විග්‍රහය

1.9 පරිච්ඡේදකරණය


**2 පරිච්ඡේදය**

**න්‍යාය සහ සංකල්ප (සංවර්ධනය සහභාගිත්ව සංවර්ධනය)** 24-47

2.1 සංවර්ධනය සංකල්පයේ විකාශය

.2.2 සහභාගිත්ව සංවර්ධනය හැඳින්වීම

2.2.1 සහභාගිත්වයේ නිර්වචනය කිරීම

2.2.2 සහභාගිත්ව සංවර්ධනය පිළිබඳ අධ්‍යයන ක්‍රමවේදයන්

2.2.3 සහභාගිත්ව සංවර්ධනය සහ සංවර්ධනයේදී සහභාගිත්වය

2.2.4 සහභාගිත්ව සංවර්ධනයේ වාසි

2.2.5 සහභාගිත්ව සංවර්ධනයේ බාධා

**3 පරිච්ඡේදය**

**සංවර්ධන සංකල්පය හා කාන්තාවන් 48-64**

3.1 සංවර්ධනය තුළ කාන්තාවන්

3.1.1. WID ප්‍රවේශයේ අංග

3.2 කාන්තාව හා සංවර්ධනය

3.3 ස්ත්‍රී පුරුෂසමාජභාවය හා සංවර්ධනය

3.4 සහස්‍ර සංවර්ධන ඉලක්ක සහ කාන්තාව

**4 වැනි පරිච්ඡේදය**

**කාන්තා සවිබලකරණයේ සංකල්පීය විග්‍රහය 65-113**

4.1 කාන්තා සවිබලකරණයේ ආරම්භය

4.2 කාන්තා සවිබලකරණය පිළිබඳ අර්ථනිරූපනය

4.3 කාන්තා සවිබලකරණයේ උපයෝගීතාවය

4.4 කාන්තා සවිබලකරණය සාමාන්‍යකරණය කිරීම

4.5 කාන්තා සවිබලකරණ ක්‍රියාවලිය

4.6 කාන්තා සවිබලකරණයේ වර්ගීකරණයන්

4.7 සවිබලගැන්වීම සඳහා ස්ත්‍රීන්ට කළ හැකි වරණයන්

4.8 සංවර්ධන සංවිධානවල ස්ත්‍රී සවිබලකරණය සඳහා වන ප්‍රතිපත්ති නිශ්චායකයන්, සහ ආකෘති

4.9 ස්ත්‍රී සවිබලකරණය මූලප්‍රවාහකරණය

4.10 කාන්තා සවිබලකරණයේ ප්‍රස්තුතයන්

4.11 කාන්තා සවිබලකරණ න්‍යායයන්

4.12 සවිබලකරණ ප්‍රවේශයන්

4.13 සවිබලකරණය මැනීම

4.13.1 කාන්තා සවිබලකරණය වැඩසටහන් දර්ශක

4.14 කාන්තා සවිබලකරණ ව්‍යාපෘති පිළිබඳ හැඳින්වීම

4.14.1 කාන්තා සංවර්ධන ව්‍යාපෘති චක්‍රය

4.14.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම

4.14.3 ව්‍යාපෘති ඇගයීම

**5 වැනි පරිච්ඡේදය** **114-168**

**කාන්තා සවිබලකරණයේ ජාත්‍යන්තර තත්ත්වය**

5.1 කාන්තා සවිබලකරණය සඳහා ජාත්‍යන්තර දායකත්වය

5.1.1 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය

5.2. දකුණු ආසියාතික රටවල කාන්තාවගේ තත්ත්වය

5.2.1 දකුණු ආසියාවේ කාන්තා සවිබලකරණ ක්‍රියාවලිය

5.2.1.1 ඉන්දීය කාන්තාවගේ සමාජ ආර්ථික පසුබිම

5.2.1.2 ඉන්දීයාවේ සවිබලකරණ ව්‍යාපෘති

5.2.2 නේපාල කාන්තාවගේ තත්ත්වය

5.2.2.1 නේපාලයේ කාන්තා සවිබලකරණ ක්‍රියාවලියේ විකාශය

5.2.2.2 කාන්තා සවිබලකරණ ව්‍යාපෘතින්

5.2.3 බංග්ලාදේශය

5.2.3.1 බංග්ලාදේශ කාන්තාවගේ තත්ත්වය

5.2.3.2 කාන්තා සවිබලකරණ ක්‍රියාවලියේ විකාශය

5.2.3.3 බංග්ලාදේශ රාජ්‍ය අංශයේ දායකත්වය

**6 වැනි පරිච්ඡේදය** **169-184**

**ශ්‍රී ලංකාවේ කාන්තා සවිබලකරණ ක්‍රියාවලියේ තත්ත්වය**

6.1 නූතන ලාංකීය කාන්තාවගේ තත්ත්වය

6.2 ලංකාවේ කාන්තා සවිබලකරණ ක්‍රියාවලිය

**7 වැනි පරිච්ඡේදය** **185-262**

**වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාන්තා සවිබලකරණ ක්‍රියාවලිය**

7.1 අධ්‍යයන ක්ෂේත්‍රය

7.1.1 ශ්‍රී ලංකා කාන්තා කාර්යංශයේ කාන්තා සංවර්ධන ව්‍යාපෘතිය

7.1.2 සමෘද්ධි වැඩසටහන

7.1.3 ඒකාබද්ධ ප්‍රජා සංවර්ධන කාන්තා මහා සංගමය

7.2 ප්‍රාථමික දත්ත විශ්ලේෂණය

7.2.1 පෞද්ගලික තොරතුරු

7.2.1.1 ආගම හා වාර්ගිකත්වය

7.1.1.2 වයස් මට්ටම

7.2.1.3 විවාහක / අවිවාහකභාවය

7.2.1.4 අධ්‍යාපන මට්ටම

7.2.1.5 පවුලේ ප්‍රධානියා

7.2.1.6 රැකියාවේ ස්වභාවය

7.2.1.7 පවුලේ ආදායම් තත්ත්වය

7.3 ආර්ථික සවිබලකරණයේ ස්වභාවය

7.4 අධ්‍යාපන සවිබලකරණය

7.5 නීතිමය සවිබලකරණය

7.6 සමාජීය සවිබලකරණය

7.7 සෞඛ්‍ය සවිබලකරණය

7.8 දේශපාලන සවිබලකරණය

7.9 සිද්ධි අධ්‍යයන

7.10 නිලධාරින් සමඟ කළ සම්මුඛ සාකච්ඡා

**8 වැනි පරිච්ඡේදය** **263-268**

**නිගමන**

8.1 නිගමන

8.2 යෝජනා

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය** **269-285**

**ඇමුණුම්** **286-299**

## සංඛ්‍යා වගු අංක


| සංඛ්‍යා වගු අංක | පිටුව |
|---|---|
| වගු අංක 01 | |
| වැලිගෙපෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහභාගීත්ව සංවර්ධන ව්‍යාපෘති සඳහා කාන්තා දායකත්වය | 10 |
| **වගු අංක 2** | |
| **සහභාගිත්ව සංවර්ධන සහ සංවර්ධනයේදී සහභාගිත්වය පිළිබඳ තුලනාත්මක විශ්ලේෂණය** | 42 |
| වගු අංක 3 විදේශගත වු කාන්තාවන් සංඛ්‍යාව | 171 |
| **වගුව අංක 4 1992 වසර තුළ අධ්‍යාපන ප්‍රතිශතය** | 173 |
| **වගුව අංක 5 ශ්‍රමදායකත්වය හා රැකියා නියුක්තිය** | 175 |
| වගු අංක 6 ව්‍යාපෘතිවල ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 187 |
| වගු අංක 7 වයස් ව්‍යුහය | 202 |
| වගු අංකය 8 විවාහක අවිවාහකභාවය | 203 |
| වගු අංක 9 අධ්‍යාපන මට්ටම | 206 |
| වගු අංක 10 පවුලේ ප්‍රධානියා | 208 |
| වගු අංකය 11 ආර්ථික සවිබලකරණයේ ස්වාභාවය | 213 |
| වගු අංක 12 ආදායම සිදු වු වෙනස | 216 |
| වගු අංක 13 දැනුවත් කිරිමේ වැඩසටහන්වල ස්වභාවය | 219 |
| වගු අංක 14 කාන්තාවන්ට නීතියේ වැදගත්වන අංශ | 223 |
| වගු අංක 15 තීරණ ගැනීමේ ක්‍රියාවලියට මුල් වන පුද්ගලයා | 226 |
| වගු අංක 16 පවුලේ මුදල් පාලන වගකීම දරණ පුද්ගලයා | 227 |
| වගු අංක 17 ගෘහස්ත කටයුතුවල වගකීම දරණ පුද්ගලයා | 229 |

වගු අංක 18 පවුල් සැලසුම් ක්‍රමයක් අනුගමනය කිරීම 232

වගු අංක 19 පවුල් සැලසුම තීරණය කිරීමේදී මූලික වූ පුද්ගලයන් 233

වගු අංක 20 දරුවන් සංඛ්‍යාව තීරණය කළ පුද්ගලයා 234

වගු අංක 21 දේශපාලන පක්ෂයක සාමාජිකත්වය දැරීම 237

වගු අංක 22 දේශපාලන පක්ෂවල සාමාජිකත්වයේ ස්වභාවය 238

වගු අංක 23 දේශපාලන පක්ෂවලට සම්බන්ධවීමට ආසන්නම හේතුව 241

වගු අංක 24 කාන්තා බලගැන්වීම පිළිබඳව දැනුවත් නිලධාරින් 261

වගු අංක 25 ආයතනය තුළ මුහුණ දෙන ගැටළු 261

වගු අංක 26 ක්ෂේත්‍රය තුළ මුහුණ දෙන ගැටළු 262

## ප්‍රස්ථාර

පිටුව

ප්‍රස්ථාර අංක 1 විවාහක අවිවාහකභාවය හා ගෘහමූලික කාන්තාවන් 204

ප්‍රස්ථාර අංක 2 අධ්‍යාපන මට්ටම 207

ප්‍රස්ථාර අංක 3 පවුලේ ප්‍රධානියා 209

## රූපසටහන්

**රූපසටහන්** **පිටුව**

රූපසටහන් අංක 1 කාන්තා බලගැන්වීමේ රාමුව 04

රූප සටහන් අංක 2 මූලාශ්‍ර 11

රූප සටහන් අංක 3 නියැදිය තෝරා ගත් ආකාරය 14

රූප සටහන් අංක 4 නියැදිය සඳහා නිලධාරින් තෝරා ගත් ආකාරය 15

රූප සටහන් අංක 5 ව්‍යාපෘති චක්‍රය 106

රූප සටහන් අංක 6 ආයතන ව්‍යුහය 200

# ස්තුතිය

- මෙම නිබන්ධය සඳහා මඟ පෙන්වීම් කළ උපදේශක ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මයුර සමරකෝන් මහතාට
- පර්යේෂණ මෙන්ම සෝදුපත් කියවා හා ඒ පිළිබඳව සොයා බලා ආරම්භයේ සිට අවසානය දක්වාම උපකාර කරමින් මා දිරිමත් කළ සමාජ හා මානව විද්‍යා අධ්‍යානංශයේ උපදේශක අනූෂා එදිරිසිංහ මහත්මියට හා උපාලි අයියාට
- පර්යේෂණ නිබන්ධයේ කටයුතු සඳහා සහාය වූ මහාචාර්ය ටෙනිසන් පෙරේරා ඇදුරුතුමා ඇතුළු සමාජ හා මානව විද්‍යා අධ්‍යානංශයේ ආචාර්ය මණ්ඩලයට
- අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කර දෙමින් උපකාර කළ මාගේ දෙමව්පියන්ට, නංගීට සහ මල්ලිලා දෙදෙනාට
- මාගේ අධ්‍යයන කටයුතු සඳහා මා දිරිමත් කරන මගේ ආදරණීය සමන්ත අයියාට
- පර්යේෂණ නිබන්ධයේ කටයුතු වලට මා හට නන් අයුරින් උදව් කළ ප්‍රියංකා, රෝස් අක්කාට
- අධ්‍යයන කටයුතු සඳහා මා රාජකාරියෙන් නිදහස් කළ ප්‍රාදේශීය ලේකම්තුමියට, මාගේ රාජකාරී කටයුතු ආවරණය කළ මාගේ මිතුරු සෙනේට, කල්පනී සහ තනූජා යන නංගිලාට ජාතික කාන්තා කමිටුවේ සභාපති තුමිය , විධායක අධ්‍යක්‍ෂ හා සියළු මිතුරියන්ට
- ක්ෂේත්‍ර කටයුතු වලදී දත්ත රැස් කිරීම සඳහා සහාය ලබා දුන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි මහා සංගමයේ හා ඒකාබද්ධ කාන්තා මහා සංගමයේ නිළධාරීන්ට
- පර්යේෂණයේ ප්‍රධාන මූලාශ්‍රය වන සියළුම දත්ත දායිකාවන්ට

# සංක්ෂිප්තය


වර්තමාන සංවර්ධන කතිකාවතෙහි වැදගත් ස්ථානයක් කාන්තාවන් සවිබල ගැන්වීම හිමි කර ගෙන තිබේ දියුණු වෙමින් පවතින රටවල් සංවර්ධනය කිරීමේ උපායමාර්ගයක් ලෙසින් සංවර්ධන විශේෂඥයින් හා සංවර්ධන නියෝජිත ආයතන එය බහුල ලෙස භාවිතා කරයි.

සමාජය තුළ මුල් බැස ගෙන ඇති ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ භාවිතයන් හා ආකල්ප හේතු කොට ගෙන කාන්තාව නොයෙකුත් අසමානකම් වලට හා වෙනස් කොට සැලකීම් වලට භාජනය වේ. මෙම තත්ත්වයන් පිළිබඳව කාන්තාව සංවේදී කර එම තත්ත්වයන්ගෙන් මිදීමට කාන්තාවන්ට අවශ්‍ය විභව ශක්තිය හා බලය කාන්තාවුළ ජනිත කිරීම සවිබලකරණ ක්‍රියාවලිය තුළදී සිදු වේ. සමාජ, ආර්ථික, සෞඛ්‍යය, දේශපාලන, නීතිය ආදී ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ කාන්තාවන් බල ගන්වනු ලැබේ.

එය ලංකාවේද සවිබලකරණය අරමුණු කරගත් ව්‍යාපෘති ප්‍රාදේශීය, කලාප, පළාත් හා ජාතික මට්ටමින් ක්‍රියාත්මක වේ. රාජ්‍ය, රාජ්‍ය නොවන ආදී වශයෙන් ක්‍රියාත්මක වන විවිධ ආයතන හඳුනා ගත හැකිය.

මෙම අධ්‍යයනයේදී කාන්තා සවිබලකරණ ක්‍රියාවලියේ ස්වාභාවය, සංවර්ධන ව්‍යාපෘති ඒ සඳහා යොදා ගන්නා උපක්‍රම, ඒවායේ ප්‍රතිඵල පිළිබඳව අවධානය යොමු විය. එසේම සවිබලකරණයේ යෙදෙන ආයතනවල කාර්යභාරයන් අධ්‍යයනයට බඳුන් විය. වැඩසටහන් වලදී ඇති වන ගැටළුකාරී තත්ත්වයන් හා නිළධාරීන් මුහුණ දෙන ගැටළුකාරී තත්ත්වයන් පිළිබඳවද විමසා බැලුනි.

# 1 වැනි පරිච්ඡේදය

**මාතෘකාව (Theme)**

**"සහභාගිත්ව සංවර්ධන ව්‍යාපෘති තුළ කාන්තා සවිබලකරණ ක්‍රියාවලිය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්" (තෝරාගත් සහභාගිත්ව සංවර්ධන ව්‍යාපෘති ඇසුරෙන්)**

## 1.1 හැඳින්වීම (Introduction)

සංවර්ධනය (Development) යන සංකල්පය වර්තමාන ලෝකයේ කාගේත් සංවාදයට ලක් වී තිබෙන මාතෘකාවක් ලෙස හඳුන්වා දිය හැකිය. ලොව පුරා සියළුම රාජ්‍යයන් දෙස බලන විට හඳුනාගත හැකි විශ්වීය ලක්ෂණයක් වනුයේ සියළුම රාජ්‍යයන් සංවර්ධනය ළඟා කරගැනීමේ ප්‍රධාන අරමුණු කොට ගෙන තම රාජ්‍ය ප්‍රතිපත්තීන් මෙහෙයවන බවයි. සංවර්ධනය පිළිබඳ අර්ථය සමාජීය විද්‍යා විශ්වකෝෂයෙහි හි සංවර්ධනය යන්න අර්ථ දක්වා ඇත්තේ මූර්ත ඒකපුද්ගල නිෂ්පාදනය සීඝ්‍රයෙන් නොකඩවා ඉහළ යාමත් ඒ සමඟම ශිල්පීය ආර්ථික, සමාජීය ආදී වෙනත් ලක්ෂණයන්හි වෙනස් වීම සංවර්ධනය යනුවෙනි (අමරසේකර, 1998: 101). මෙම අර්ථ නිරූපනයට අනුව ආර්ථික සාධක මෙන්ම ආර්ථික නොවන සාධකයන් ද සංවර්ධනයේදී බලපෑම් එල්ල කරනු ලබන බව පෙන්වා දෙයි.

ලොව රාජ්‍යයන් සංවර්ධනය කරා යන ගමනේදී විවිධ සංවර්ධන ක්‍රමවේදයන් අනුගමනය කරනු ලබයි. වර්තමාන සංවර්ධන විශේෂඥයින් හා ප්‍රතිපත්ති සම්පාදකයන් අතර භාවිතයට ලක්වන්නා වූ සංවර්ධන ක්‍රමවේදයක් ලෙස සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය (Participatory Development Method) පෙන්වා දිය හැකිය. සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදයේ මූලධර්මය සංවර්ධනය සඳහා ප්‍රජාව ඍජුවම දායක වීමයි. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සංවර්ධන